රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: (94) 011- 2694560
ෆැක්ස් / தொலைநகல் / Fax: (94) 011- 2692254
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: dgcs@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: COM/TRANS/V/වා.ස්.මා./2024
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.10.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**2024 වාර්ෂික ස්ථාන මාරුවීම් - ( ඒකාබද්ධ සේවය)**
**රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය,**
**සංවර්ධන නිලධාරී සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය ,**
**ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය**

මේ සමග අමුණා ඇති උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් **2024.01.01** දින හෝ නිලධරයන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. මේ බව ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ අදාළ නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙනු මැනවි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව / අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව / මැතිවරණ කොමිෂන් සභාව යන ස්ථානවලට ස්ථාන මාරු කරන ලද නිලධරයන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක විය යුත්තේ අදාළ ආයතන ප්‍රධානීන්ගේ එකඟත්වයට යටත්ව බවද දන්වමි.

02. ඒකාබද්ධ සේවයේ ස්ථානමාරු නියෝගවලට යටත් යම්කිසි නිලධරයෙකුට ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ පිහිටුවා ඇති අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු මඟින් ස්ථානමාරු නියෝග ලබා නොදිය යුතුය. යම්හෙයකින් අභ්‍යන්තර මාරු කිරීම් සඳහා නියෝග නිකුත්කර ඇත්නම් එහිදී ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරු නියෝගයන් ක්‍රියාත්මක විය යුතු වේ. එසේ වුවද නිලධරයන්ගේ ඉල්ලීම මත අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාල අවශ්‍යතාවයන් මත අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කාර්යාල විසින් දී ඇති ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු යැයි ඔබ අදහස් කරන්නේ නම් මෙම ලිපියේ 06 වන ඡේදයේ සඳහන් වන දිනට පෙර ඔබගේ නිර්දේශ ද ඇතිව අදාළ ඉල්ලීම සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ලබා ගැනීම මැනවි.

03. මෙම ස්ථාන මාරු නියෝගවලට යටත් නිලධරයෙකුට 2023.12.31 දින දක්වා දීර්ඝ කරන ලද, මීට ඉහතදී නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝගයන් වේ නම් එවැනි නිලධරයකුට නැවත 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග මඟින් වෙනත් ස්ථාන මාරු නියෝගයක් ලබාදී ඇත්නම් එහිදී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත වන බව සලකන්න.

04. මෙම ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී මාරුවීම් කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පටිපාටිය, 2023.08.25 දිනැති අංක 01/2023 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි ඇතුළත්ව ඇත. එම චක්‍රලේඛයෙහි හෝ අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව වාර්ෂික ස්ථානමාරු කමිටුවේ අවධානයට යොමු වී නොමැත්තේ නම් පමණක් වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/07/14/2013 හා 2013.09.13 දිනැති ලිපිය මඟින් දන්වා ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය ලබා දීමෙන් පසුව නැවත සිදුකරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබාදෙනු ලැබේ. ඉන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, දුක් ගැනවිලි හේතුවෙන් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ මත හෝ වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත දිනෙන් පසුවට කල් දමනු නොලැබේ. වාර්ෂික

ස්ථාන මාරු සම්බන්ධයෙන් වූ අභියාචනාවකට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දුන් තීරණ, එකී තීරණ ක්‍රියාත්මක වීම වළකාලන නියෝගයක් නොමැති නම් වහාම ක්‍රියාත්මක කළ යුතුය.

06. ඒකාබද්ධ සේවයේ සියලු නිලධාරීන් වාර්ෂික ස්ථානමාරු සම්බන්ධ අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා අන්තර්ජාලයට පිවිසීමට භාවිතා කරනු ලබන්නේ,

i. LGN Wi-Fi ජාලය නම් http://10.250.1.112/misco ඔස්සේද,
ii. වෙනත් ජාලයක් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සලසා ගන්නේ නම් http://43.224.125.68/misco යන වෙබ් ලිපිනය ඔස්සේද,

මාර්ගගත මෘදුකාංගය (Online Application) තුලට පිවිස, තම අභියාචනය 2023.11.02 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වේ. එම අයදුම්පතෙහි දෘඩ පිටපතක් ආයතන ප්‍රධානියා මගින් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත යොමු කරන ලෙසද කාරුණිකව දන්වමි.

07. 2024 වාර්ෂික ස්ථාන මාරු තීරණ යටතේ ඔබ කාර්යාලයෙන් පිටතට ස්ථාන මාරුවීමට නියමිත හා ඔබ කාර්යාලය වෙත ස්ථාන මාරුවී පැමිණීමට නියමිත ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ නාම ලේඛන, මාර්ගගත මෘදුකාංගයේ Transfer -- Report යටතේ “Transfer Report – I” හා “Transfer Report –II” ඔස්සේ ලබා ගත හැක. එසේම ඔබ අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධාරීන්, **අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන** නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, මෙම ස්ථාන මාරුවීම් ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කළ යුතු බැව් ද දන්වමි. විධිමත් අනුමැතියකින් තොරව මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හැර සිටින නිලධාරීන් සම්බන්ධයෙන් අංක 01/2023 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි 9.4 වගන්තිය අනුව කටයුතු කළ හැකි බවද දන්වමි.

08. දැනට සේවය කරන කාර්ය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයන්ට මෙම වාර්ෂික ස්ථාන මාරු වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතු වේ. උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

09. අමාත්‍යාංශයන්හි විෂය පථය වෙනස්වීම මත ඇතැම් නිලධාරීන්ගේ සේවා ස්ථානයන්හි වෙනස්කම් සිදුව ඇති බැවින් හා එවැනි සේවා ස්ථානයක සේවය කරන නිලධාරියෙකු හට 2024 වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලබා දී ඇත්නම්, එම නිලධාරියා මේ වන විට සේවය කරන සේවා ස්ථානය වෙත ඔහුගේ / ඇයගේ අනුප්‍රාප්තික නිලධාරියා වාර්තා කළ යුතු වේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්


දුරකතන අංකය 011 2694560
ෆැක්ස් 011 2692254
ඊ තැපැල් ලිපිනය dgcs.pubad@gmail.com